*සියලුම හිමිකම් ඇවිරිණි.*
*All Rights Reserved*

## අවසාන වාර පරීක්ෂණය 2015

# පෙරදිග සංගීතය

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

### I - කොටස

- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සප්තකයේ චල ස්වර ගණන,
(1) 4 කි. (2) 5 කි. (3) 7 කි. (4) 2 කි.

02. ම්̇ ගි̇ රි̇ සි̇ මෙසේ සටහන් කරනු ලබන ස්වර අයත්වන සප්තකය නම්,
(1) මන්ද්‍ර (2) මධ්‍ය (3) උච්ච (4) කෝමල

03. පෙරදිග තීවරය ස්වරයට අදාළ අපරදිග නාමය වන්නේ,
(1) Flat (ෆ්ලැට්) (2) Sharp (ෂාප්) (3) Natural (නැචුරල්) (4) Tempo (ටෙම්පෝ)

04. ස ස ස රි ග ම, රි රි රි ග ම ප, ........... මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර කොටස වන්නේ,
(1) ගග ගපමග (2) ගම ගමපධ (3) මම මපධනි (4) පප පධනිස̣

05. සුවඳ පත්ම ඕලු ආදි ගීතයේ මාත්‍රා බෙදීම සිදුවනුයේ,
(1) 2 න් 2 ට (2) 3 න් 3 ට (3) 4 න් 4 ට (4) 2 හා 3 ආකාරයට

- **A හා B නිවැරදිව යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 06. | වයලීනය | (i) | ස්වර ස්ථාපන ගීතයකි |
| 07. | විකෘති ස්වර මේ නමින්ද හැඳින්වේ | (ii) | යක්බෙරය |
| | කෝලම් නාට්‍ය හා සම්බන්ධ වේ. | (iii) | කෝමල ස්වරයි |
| 08. | බටනලාව | (iv) | තත් වාද්‍ය භාණ්ඩයකි |
| 09. | ශුද්ධ ස්වරයට වඩා හඬ භාගයක් අඩු ස්වරය | (v) | චල ස්වර |
| 10. | සවන පිනන ගීත මිහිර | (vi) | බන්සුරි මුරලි වශයෙන් දෙවර්ගයකි |

- **පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11. සිතාරයට අයත් තත් ගණන 04 කි. ( )
12. දරු නැළවිලි ගී තුළින් භක්ති රසය මතුවේ. ( )
13. රබාන විජයබා රජුගේ විවාහ මංගල්‍ය හා සම්බන්ධය. ( )
14. කෝලම් වේදිකා නාට්‍යයකි. ( )
15. ''කරුණාව සමඟ හොඳ හිත පතුරන්න'' ගීතය උපදේශාත්මක ගීතයකි. ( )

16. ෆින්ගර් බෝඩ්, සවුන්ඩ් බොක්ස්, සවුන්ඩ් හෝල්, චින් රෙස්ට් වැනි අංග ඇතුළත් සංගීත භාණ්ඩය වන්නේ,
(1) සිතාරය (2) බටනලාව (3) සර්පිනාව (4) වයලීනය

17. බටහිර සංගීතයේ එන A, B යන ස්වර පෙරදිග ක්‍රමයට අනුව හඳුන්වනු ලබන්නේ,
(1) ග , ම (2) ධ , නි (3) රි , ග (4) නි , ස

18. ''දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා'' මේ ගීතය නම් කළ හැක්කේ,
(1) වේදිකා නාට්‍ය ගී (2) ගැමි නාට්‍ය ගී (3) නූර්ති නාට්‍ය ගී (4) සරල ගී

19. සංගීතයට උපයෝගී කරගන්නා සම්පූර්ණ ස්වර දොළහ ලියා දක්වීමේදී ශුද්ධ 'ග' ළඟට යෙදෙන ස්වරය වන්නේ,
(1) ම ස්වරයයි. (2) කෝමල ග ස්වරයයි. (3) තීවර ම ස්වරයයි. (4) ප ස්වරයයි.

20. ''ගංගාවේ හා වෙල්යායේ'' මේ ගී පාදයට අදාළ ස්වර පේළිය වනුයේ,
(1) ස ස රි රි | ග ම | ස රි ග ම | ප ධ ප
(2) ස රි ග ම | රි ග ම ප | ග ම ප ධ | නි ස
(3) ස රි ග ම | ප | ප ම ග රි | ස
(4) ස රි | ග ම | ග රි | ස

## II - කොටස

- ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.




(01) i. අංක 01 සිට 04 යතුරු වලින් හැඳින්වෙන ස්වරයන් මොනවා ද? (ල.02)

ii. කෝමල ස්වර හැඳින්වෙන්නේ කුමන අංක වලින් ද? (ල.02)

iii. 4 හා 5 අංක අතර පිහිටන ස්වරය හා එහි අංකය ලියන්න. (ල.02)

iv. මෙම ස්වර පුවරුවේ අචල ස්වර හඳුන්වන්නේ කුමන අංක වලින්ද? (ල.02)

v. ස්වර පුවරුවේ 2 වන අංකයේ අදාළ ස්වරය බටහිර සංගීතයට අනුව හඳුන්වන්නේ කුමන නමකින් ද? (ල.02)

(02)

| | | | |
|---|---|---|---|
| ස ස රි රි | ග රි ස | රි රි ම ම | ප |
| පො ත ප ත | කි ය වා ऽ | නු ව න ල | බා ऽऽऽ |

i. ඉහත ස්වර ස්ථාපන ගීතයේ ඉතිරි ස්වර සහ ගී පාද ප්‍රස්තාර කරන්න. (ල.04)

ii. මෙම ස්වර ස්ථාපන ගීතය හඳුන්වන්නේ කුමන නමකින් ද? (ල.02)

iii. ග රි ස රි ග .......... මෙම ස්වර අභ්‍යාසය ආරෝහණ අවරෝහණ ආකාරයට ගොඩ නඟන්න. (ල.04)

(03) ඉදිරිපස රූප සටහනින් දක්වා ඇත්තේ වයලීනයේ තත් පිහිටා ඇති ආකාරය හා ස්වර පිහිටා ඇති ආකරයයි.



i. එම රූප සටහනේ වමේ සිට පටන්ගෙන වයලීනයේ තත් පෙරදිග ක්‍රමයට ලකුණු කරන්න. (ල.02)

ii. පෙරදිග ක්‍රමයට ලකුණු කළ ස්වරයන්ට ඉහළින් බටහිර ක්‍රමයට වයලීනයේ තත් නම් කරන ආකාරය සටහන් කරන්න. (ල.02)

iii. වම් කෙළවරේ පළමු තතෙහි තිත් මඟින් ලකුණු කර ඇති ස්වර ලියන්න. (ල.02)

iv. වයලීනය පිළිබඳ විශේෂ කරුණු 04 ක් සඳහන් කරන්න. (ල.04)

The National e-Learning Portal for The General Education

(04)

| (අ) | (ආ) |
|---|---|
| සම්මා සම්බුදු වෙණමුණි රජුනේ | සඳුන් කොකුම් මොරසුගාන |
| දම්මා දස අකුසල අත මිදුනේ | මුදුන් කරල වරල බඳින |
| නම්මා ගෙන සිත දහමට යෙදුනේ | රජුන් සමඟ ඇමති සිටින |
| අම්මා වැනි කුසලට තුන් සරණේ | ළඳුන් දුටද රජගෙට යන |

i. ඉහත (අ) සහ (ආ) කොටසට අයත් ගීත වර්ග වෙන වෙනම හඳුන්වන්න. (ල.02)

ii. ඉහත (අ), (ආ) වර්ග වලට අයත් කරුණු පොදුවේ පහත සඳහන් වේ. එම කරුණු ඔබ හඳුනාගත් වර්ග යටතේ පෙළගස්වන්න.

- ★ සැදැහැ සිතින් ගායනයේ යෙදෙයි.
- ★ නායකත්වය හා වැඩිහිටි බව ගරු කරමින් ඔවුන් අනුගමනය කරමින් ගයයි.
- ★ ගායනයත් සමඟ නර්තන අංග යොදා ගෙන ඇති බව.
- ★ ශුද්ධ ස්වර හා කෝමල ස්වර ඇතුළත් නාදමාලා දෙකක් ප්‍රචලිතව ඇති බව.
- ★ ජාතික ක්‍රීඩා උත්සව වලදී ගායනය වාදනය කරන බව.
- ★ තෙරුවන් කෙරෙහි භක්තියෙන් ගායනය කරයි.
- ★ ජන ජීවිතයේ විවිධ විනෝදාත්මක අවස්ථා සඳහා යොදා ගෙන ඇත.
- ★ කෙළි ගී හා සම්බන්ධ ගායනාවකි. (ල.08)

(05) කෝලම් නාට්‍ය ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. (ල.10)

| කෝලම් නිර්වචනය කිරීම | පවතින ප්‍රදේශ | යොදාගන්නා සංගීත භාණ්ඩ | නාට්‍ය කිහිපයක් නම් කිරීම | විශේෂ ලක්ෂණ 04 ක් |
|---|---|---|---|---|
| | | | | 1.<br>2.<br>3.<br>4. |